(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **171.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 ජූනි මස 07 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු බිමල් රත්නායක මහතා
ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
ගරු ඒ. ඒ. විජේතුංග මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු හේෂාන් විතානගේ මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු සන්දිත් සමරසිංහ මහතා
ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
ගරු මුත්තු සිවලිංගම් මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු කනක හේරත් මහතා

නීල් ඉද්දවල මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව 'අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක්, 2017 ජූනි 06 දින මාගේ නිවේදනයේ සඳහන් පෙත්සමට අමතරව මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වගන්තියේ (ඉ) ඡේදය සහ 21 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 වගන්තිය යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් පිළිගන්වා, එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ජනාධිපතිවරයාගේ අරමුදල පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අධ්‍යයන පීඨයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 අප්‍රේල් 19 දිනැති අංක 2015/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධන වාර්තාව හා වාර්ෂික ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා විදේශ රැකියා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රතිසන්ධාන හා උතුරු හා නැගෙනහිර නැවත ගොඩනැගීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(16) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වගන්තියේ (3) උප වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 19 දිනැති අංක 2019/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පෙත්සම් :**

(1) වත්තල, හැඳල, ශාන්ත සෙබස්තියන් පාර, අංක 48/6 දරන ස්ථානයෙහි පදිංචි එන්. මනුවෙල්පිල්ලේ මහතාගෙන් ලැබුණු 2017.02.28 දිනැති පෙත්සම ගරු ජෝන් අමරතුංග මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මතුගම, යටදොලවත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ. එස්. ඒ. චන්ද්‍රලතා සීමන් මහත්මියගෙන් ලැබුණු 2016.12.20 දිනැති පෙත්සම;

(ii) හොරණ, ජයසූරිය මාවත, අංක 10/05 දරන ස්ථානයෙහි පදිංචි එච්. එම්. පුන්‍යමාලි අමරසේන මහත්මියගෙන් ලැබුණු 2017.02.12 දිනැති පෙත්සම;

(iii) බණ්ඩාරගම, වෑවිට, ශ්‍රී රාජ් යන ලිපිනයෙහි පදිංචි ජේ. ස්වර්ණලතා මහත්මියගෙන් ලැබුණු 2017.03.14 දිනැති පෙත්සම;

(iv) පෝරුවදණ්ඩ, ගුරුගොඩ, අංක 267 දරන ස්ථානයෙහි පදිංචි කේ. විමලසේන මහතාගෙන් ලැබුණු 2017.02.02 දිනැති පෙත්සම;

(v) පානදුර, තන්ත්‍රිමුල්ල, ජයවර්ධන පටුමග, ඉන්ද්‍රජෝති මාවත, අංක 122/සී දරන ස්ථානයෙහි පදිංචි එන්. එස්. දසනායක මහතාගෙන් ලැබුණු 2017.01.28 දිනැති පෙත්සම; සහ

(vi) බණ්ඩාරගම, ගුංගමුව, ගුණානන්ද මාවත, අංක 110/5 දරන ස්ථානයෙහි පදිංචි පී. එල්. සිරියාවතී අල්විස් මහත්මියගෙන් ලැබුණු 2017.03.22 දිනැති පෙත්සම

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) වේයන්ගොඩ දුම්රිය ස්ථානයේ, දුම්රිය ස්ථානාධිපති ආර්. එස්. එස්. එම්. එම්. එච්. ඩී. හේරත් මහතාගෙන් ලැබුණු 2017.03.18 දිනැති පෙත්සම ගරු අශෝක් අබේසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) වත්තල, හැඳල, පල්ලියවත්ත, 3 වැනි පටුමග, අංක 26/11 දරන ස්ථානයෙහි පදිංචි කේ. ජී. ආර්. ඩයස් මහතාගෙන් ලැබුණු 2017.04.24 දිනැති පෙත්සම; සහ

(ii) පට්ටියාවත්ත, උඩ බොකලවල, අංක 1/3 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. පී. සී. වීරසිංහ මහත්මියගෙන් ලැබුණු 2017.02.14 දිනැති පෙත්සම

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) කින්නියා, කුරිංචාකේණි - 03 දරන ස්ථානයෙහි පදිංචි අහමදු ජාන් රසූල් ජාන් මහතාගෙන් ලැබුණු 2016.12.22 දිනැති පෙත්සම; සහ

(ii) අක්කරපත්තුව 17, මුඩලියර් පාර, අංක 180/1 දරන ස්ථානයෙහි පදිංචි මොහොමඩ් කාසිම් අබ්දුල් මජීඩ් මහතාගෙන් ලැබුණු 2017.01.02 දිනැති පෙත්සම

ගරු එම්. එස්. තෞෆික් මහතා විසින් පිළිගන්වන ලදී.

(6) නාවලපිටිය, හරංගලගම, අංක 18/2, එස්. ආනන්ද පරණවිතාන මහතා බාරේ යන ලිපිනයෙහි පදිංචි ඒ. වී. මුදියන්සේ මහතාගෙන් ලැබුණු 2017.02.06 දිනැති පෙත්සම ගරු කේ. කේ. පියදාස මහතා විසින් පිළිගන්වන ලදී.

(7) ත්‍රිකුණාමලය, තම්පලාගාමම්, වරිනමෙදු යන ලිපිනයෙහි පදිංචි ටී. සන්මුගලිංගම් මහතාගෙන් ලැබුණු 2016.11.28 දිනැති පෙත්සම ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2017 ජූනි මස 09 වැනි සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.01 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

**5. ක්‍රීඩා පනත යටතේ නියෝග :** ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ 2017 පෙබරවාරි 13 දිනැති අංක 2006/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.19 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ක්‍රීඩා අමාත්‍යතුමා යෝජනා කළේය.

(අ. භා. 4.30 ට ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.35 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. කල් තැබීම (පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය නිසා සිදුවන පරිසර විනාශය) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 6.29 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.24 ට, අද දින සභා සම්මතිය අනුව, 2017 ජූනි මස 09 වැනි සිකුරාදා පූ. භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.